**මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දින ද පසුගිය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 30 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මන්මුනේ නිරිත ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

ණය ලෙජරය ප්‍රකාරව 2016 දෙසැම්බර් 31 පැවැති සේවක ණය ශේෂය රු.3,277,894 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනයේ මෙම ශේෂය රු.3,618,969 ක් වශයෙන් දක්වා තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ සේවක ණය ශේෂය රු.341,075 කින් වැඩියෙන් දක්වා තිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පහත දැක්වෙන එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (i) | ඉඩම් හා ගොඩනැගිලි | 161,153,332 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (ii) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 2,855,423 | |
| (iii) | මෝටර් රථ වාහන සහ කරත්ත | 11,750,000 | |
| (iv) | ලී බඩු හා උපකරණ | 5,727,447 | |
| (v) | ගබඩාවේ තොග | 102,009 | ගබඩා ලෙජරය |

**1.3.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම**

2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග ලේඛනගත කිරීම සඳහා සභාව විසින් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,604,178 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,685,067 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කර 2016 දෙසැම්බර් 31 දිනට පෙර සම්පූර්ණ කිරීමට නියමිතව පැවති මාර්ග අලුත්වැඩියා, කානු ඉදිකිරීම හා පානීය ජලය ලබාදීමේ කටයුතු 2017 ජුනි 30 දින වන විටත් ආරම්භ කර නොතිබූ නමුත්, එම කර්මාන්ත සෑහීමට පත්විය හැකි අයුරින් අවසන් කර ඇති බවට

තාක්ෂණ නිලධාරීගේ නිර්දේශය මත එම අමාත්‍යාංශයෙන් 2016 දෙසැම්බර් 31 දින රු.1,098,040 ක මුදලක් ලබාගෙන තිබුණි.

(ආ) ගම්මාන 04 කට පානීය ජලය ලබාදීම සඳහා ජල නළ එළීමේ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට භාර දී ඒ සඳහා රු.4,000,000 ක මුදලක් 2016 දෙසැම්බර් 27 දින ලබාදී තිබුණත් එම වැඩ කටයුතු මේ දක්වා ආරම්භ කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 නිරවුල් නොකළ විගණන ඡේද

සභාව සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරනු ලැබූ විගණන ඡේදවලින් අනාවරණය කරනු ලැබූ ඌනතාවයන් සහ අඩුපාඩු සම්බන්ධයෙන් සභාව මේ දක්වා නිවැරදි කර නොතිබූ විගණන ඡේදවලට යොමුව පහත දැක්වේ.

| වාර්තාවට යොමුව | | ඇතුළත් විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2015 | 2.2.6 (I) | ඇප මුදල් ලබාගත යුතු නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබා නොගැනීම. |
| 2015 | 4.1 | විශ්‍රාම ගිය සහ මිය ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.189,947 ක හිඟ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබීම. |

**4.2 පද්ධති හා පාලන**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් |
|---|---|
| (අ) ගිණුම්කරණය | තැන්පත් ලෙජරය යාවත්කාලීනව පවත්වා නොතිබීම. |
| (ආ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |